**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය -4 කොටස - 2018**

-----------------------------------------------------------------

**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 4 කොටස 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------------------

**ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, දැනටමත් ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය (කොළඹ සිට මාතර) මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීමෙන් වාණිජ නගරය (කොළඹ) සහ අලුතින් ඉදිකරන ලද වරාය (හම්බන්තොට) සහ ජාත්‍යන්තර ගුවන්තොටුපල (මත්තල) අතර සම්බන්ධතාවයක් ඇති කිරීමයි. ව්‍යාපෘතියේ අදියර 04 යටතේ අන්දරවැව හරහා මත්තල සිට හම්බන්තොට දක්වා කිලෝමීටර් 25 ක දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 55,965 ක් වූ අතර ඉන් සිවිල් කොන්ත්‍රාත් වැඩ සහ උපදේශන සේවා සඳහා රු. මිලියන 55,615 කට සමාන එ.ජ.ඩො. මිලියන 435 ක් සැපයීමට චීන අපනයන ආනයන බැංකුව එකඟ වී තිබුණි. රු. මිලියන 350 ක් වන ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ 2016 ජනවාරි 19 දින ආරම්භ කරන ලද අතර 2019 ජනවාරි 19 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබූ අතර පසුව 2019 ජූලි 09 දක්වා දීර්ඝ කරන ලදී.**

**1.3 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

**මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------------

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

-----------------------------------------------------------------------------------

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

**1.6** **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ඊට සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව 2018 දෙසැම්බර් වන විට ඉඩම් අත්පත් කර ගැනීමේදී වන්දි ගෙවීම ප්‍රමාද වීම මත ගෙවීමට අවශ්‍ය රු. මිලියන 3.36 ක පොලිය | වත්කම් සහ වගකීම් අවතක්සේරු වීම. | ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් තොරතුරු ලබාගෙන මූල්‍ය ප්‍රකාශනවලට | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව ප්‍රතිපාදන සිදුකල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | | ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩවල ඇතුලත් රු. මිලියන 106.78 ක් වටිනා ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ වෙන වෙනම පෙන්වා නොතිබුණි. | ජංගම නොවන වත්කම් වෙන වෙනම හඳුනා ගත නොහැකි වීම. | මෙම වත්කම් මූල්‍ය තත්ත්වය තුළ වෙන වෙනම ගිණුම්ගත කිරීමට අවශ්‍ය නම්, මෙම වත්කම්වල වෘත්තීය තක්සේරුව සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවේ. | වත්කම්වල පිරිවැය වෙන වෙනම හඳුනාගෙන ජංගම නොවන වත්කම් යටතේ පෙන්විය යුතුය. |
| (ඇ) | ගිවිසුමට අනුව කොන්ත්‍රාත් සඳහා ගෙවීම් සිදුකළ යුත්තේ ශ්‍රී ලංකා රුපියල්වලින් සහ එ.ජ. ඩොලර් වලිනි. කෙසේ වෙතත්, චීන ආර්එම්බීවලින් කොන්ත්‍රාත්කරුට ගෙවීම හේතුවෙන් රු. මිලියන 205.7 ක පාඩුවක් කොන්ත්‍රාත්කරුට දැරීමට සිදු විය. මෙම අලාභය ව්‍යාපෘතිය මගින් ප්‍රතිපූරණය කළ යුතු වුවද එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | වත්කම් සහ වගකීම් අවතක්සේරු වීම. | අදහස් දක්වා නොතිබුණි | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව ප්‍රතිපාදන හෝ හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය. |

**3.** භෞතික කාර්යසාධනය

**3.1** කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2014 මැයි 21 දින ආරම්භ කරන ලද අතර එය 2014 නොවැම්බර් 19 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටින නිලධාරීන් සඳහා දිරි දීමනා වශයෙන් රු. මිලියන 4.1 ක සමුච්චිත මුදලක් ගෙවා තිබුණද, 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. තවද, වන්දි සඳහා පොලී වශයෙන් රු. මිලියන 3.36 ක මුදලක් ගෙවීමට සිදුවන බවද අනාවරණය විය. | ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2014 අප්‍රේල් මාසයේදී ආරම්භ වූ අතර 2015 ආණ්ඩු වෙනස් වීමෙන් පසු ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවා 2015 ඔක්තෝබර් මාසයේදී නැවත ආරම්භ කරන ලදී. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ඇතැම් අවස්ථාවල හිමිකාරිත්වය තීරණය කිරීමේ සංකීර්ණත්වය හේතුවෙන්, අයිතිය පිළිබඳ තීරණය ප්‍රමාද විය. තවද, ඉඩම් අත්පත් කර ගැනීමේ ගෙවීම් සඳහා නියමිත වේලාවට භාණ්ඩාගාරයෙන් මුදල් නිදහස් කර නොතිබුණි. එම නිසා දිරි දීමනා සඳහා පවා පොලී ගෙවීමට සිදු විය. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |